# ආයතනයේ නම: ආරක්ෂක අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

# நிறுவனத்தின் பெயர்: பாதுகாப்பு அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்கு குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்பட்டு நடவடிக்கைகளும் பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்.

# Name of the Institution: Ministry of Defence

**Submission of Observations of Hon. Minister and Steps Taken with Regard to the Reports Tabled by the Committee on Public Accounts in Terms of Standing Order No:119(4)**

# පටුන/பக்கம்/Contents


| භාෂාව / மொழி / Language | පිටු අංකය/பக்க இலக்கம்/ Page Number |
|---|---|
| සිංහල / சிங்களம் / Sinhala | 1-34 |
| දෙමළ / தமிழ் / Tamil | 35-73 |
| ඉංග්‍රීසි / ஆங்கிலம் / English | 74-106 |

# පටුන

| අනු අංකය | ආයතනයේ / දෙපාර්තමේන්තුවේ නම | පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 183 හි අදාළ නිරීක්ෂණ දැක්වෙන පිටු අංක | ආයතන / දෙපාර්තමේන්තු වලට අදාළ නිරීක්ෂණ හා ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග ඇතුලත් පිටු අංකය |
|---|---|---|---|
| 1 | ආරක්ෂක අමාත්‍යාංශය | 68-69 | 3-6 |
| 2 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 122 | 7-11 |
| 3 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 123-124 | 12-14 |
| 4 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 126-127 | 15-19 |
| 5 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 95-96 | 20-27 |
| 6 | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | 142-143 | 28-29 |
| 7 | කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 112-113 | 30-34 |

<u>ඇමුණුම්</u>


| | |
|---|---|
| සේවා අංශයේ 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂයට වඩා පැවති අත්තිකාරම් බී ගිණුමේ හිඟ ණය මුදල් නිරවුල් කර ගැනීමේ ප්‍රගතිය. | ඇමුණුම - i |
| සේවා අංශයේ හිඟ ණය ශේෂ ඇති වීම වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග. | ඇමුණුම - ii |
| අත්තිකාරම් බී ගිණුමේ 2022.12.31 දිනට නිරවුල් නොවූ ණය ශේෂ වල කාල විශ්ලේෂණය හා ප්‍රගතිය. | ඇමුණුම - iii |
| සිවිල් අංශයේ හිඟ ණය ශේෂ අයකර ගැනීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රගතිය. | ඇමුණුම - iv |
| කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යවා ඇති මෝටර් රථ වාහන භාවිතය පිළිබඳ විස්තරය | ඇමුණුම - v (පිටු 02) |
| කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යවා ඇති ඉඩම් භාවිතය හා ගොඩනැගිලි භාවිතය පිළිබඳ ලිපිය. | ඇමුණුම - vi |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වලින් ඉවත් වූ අපහරණය කල අබලි ද්‍රව්‍ය වල තක්සේරු වටිනාකම ඇතුලත් කරමින් කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යවා ඇති ලිපිය. | ඇමුණුම - vii (පිටු 02) |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වලින් ඉවත් වූ අපහරණය කල අබලි ද්‍රව්‍ය වල විස්තර ඇතුලත් කරමින් කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යවා ඇති ලිපිය. | ඇමුණුම - viii (පිටු 03) |
| ආපදා ණය රු.14,092.00 ක ප්‍රමාණය කපා හැරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය මඟින් අවසර ලබාදුන් ලිපිය. | ඇමුණුම - ix |
| ආපදා ණය රු.14,092.00 ක ප්‍රමාණය කපා හරින ලද මාරු කිරීම් පත්‍රය. | ඇමුණුම - x |
| ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ලඟාකර ගැනීමට අදාළව සකස් කරන ලද වාර්තාව. | ඇමුණුම - xi |

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 183 මඟින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආරක්ෂක අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම මුදල් වර්ෂය - 2020.**

## 1. ආරක්ෂක අමාත්‍යාංශය

| කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේශ | අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
|---|---|
| **පළමු කොටස** | |
| 1. බඩු ලේඛන පොත යාවත්කාලීනව පවත්වා නැත.<br><br>2. තොග පොත යාවත්කාලීනව පවත්වා නැත. | මේ වන විට අමාත්‍යාංශයේ තොග පාලනයට අදාළ තොග පොත්, ඉන්වෙන්ට්‍රි පොත් හා අනෙකුත් ලේඛන මුදල් රෙගුලාසි අනුව නඩත්තු කිරීම සිදු කරනු ලබයි.<br><br>වර්තමානය වන විට පාරිභෝජ්‍ය භාණ්ඩ ගබඩාව / ප්‍රාග්ධන භාණ්ඩ ගබඩාව වෙත ලැබෙන සෑම මිලදී ගැනීමක් වෙනුවෙන්ම පොදු 219 ආකෘති පත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කරන අතර, එමඟින් බඩු ලේඛන පොත් / තොග පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.<br><br>මීට අමතරව පාරිභෝජ්‍ය භාණ්ඩ ගබඩාවෙන් /ප්‍රාග්ධන ගබඩාවෙන් සිදු කරනු ලබන සෑම භාණ්ඩ නිකුත් කිරීමකටම අදාළව පොදු 141 ආකෘති පත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කරන අතර, එම ආකෘති පත්‍ර භාවිතා කරමින් අදාළ නිකුත් කිරීම් සම්බන්ධ බඩු ලේඛන පොත් / තොග පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.<br><br>මේ වන විට අවස්ථානුකූලව සමීක්ෂණ මණ්ඩලය මඟින් බඩු ලේඛන පොත් / තොග පොත් වල ශේෂයන් භෞතික ශේෂයන් සමඟ සත්‍යාපනය කිරීමට සමීක්ෂණ මණ්ඩල පත්කර අදාළ සත්‍යාපන කටයුතු සිදුකර ඇත. |
| 3. විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2 ක් වත් පවත්වා නොතිබුණි. | රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රැස්වීම් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික ගැටලු පැන නැගුන බැවින් 2020 වර්ෂයේදී 2020.01.28 හා 2020.07.01 දිනයන්හි දී පමණක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පවත්වා ඇත. |

| | |
|---|---|
| | එසේම කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMA/AMC/M/2020/5 – 4 හා 2020.06.02 දිනැති ලිපිය මඟින් ද 2020 වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 4 ක් පැවත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත.<br><br>කෙසේ නමුදු කොවිඩ් වසංගත තත්ත්වය ක්‍රමයෙන් පහව යාම හේතු කොටගෙන මේ වන විට එක් කාර්තුවකට එක් රැස්වීමක් බැගින් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4 ක් පැවත්වීමට සැලසුම් කර ඇත. |
| 4. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වර්තමානය වන විට අමාත්‍යාංශ වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත. |
| 5. වාහනයක් ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | මේ වන විට ගර්හිත තත්ත්වයට පත්ව ඇති වාහන අපහරණය කර ඇති අතර, ඉදිරියේදී ගර්හිත තත්ත්වයට පත්වන වාහන අපහරණය කිරීම සඳහා වත්කම් කළමනාකරණ අංශය හරහා අවශ්‍ය කටයුතු යොදා ඇත. |
| 6. සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි. | ලොග් පොත් ප්‍රවාහන අංශය මඟින් හා යාන්ත්‍රික ඉංජිනේරු අංශය මඟින් යාවත්කාලීන කිරීම සඳහා ඉදිරි කටයුතු යොදා ඇත. |
| 7. 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි. | රට තුළ ඇති වී ඇති ආර්ථික අර්බුධකාරී තත්ත්වය හේතුවෙන් ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් තව දුරටත් සිදු කිරීම දුෂ්කර වී ඇති අතර, ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු යොදා ඇත. |
| 8. මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකර ගෙන තිබුණි. | රාජ්‍ය වියදම් කළමනාකරණයට අදාළව භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කරනු ලබන චක්‍රලේඛන මඟින් ලබාදෙන උපදෙස් ප්‍රකාරව පවතින ප්‍රතිපාදන සීමාව තුළ පිහිටා බැදීම් හා බැරකම් වලට එළඹීමට ඇති මූල්‍ය විනය පිළිබඳව වරින් වර ඒ ඒ ආයතන වල වැය විෂයභාර නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බැවින් මේ වන විට මෙම තත්ත්වය අවම කර ඇත. |

9. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම යටතේ වර්තමානයේ පවතින ණය ශේෂයන් නිරවුල් කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

| කාලය (වසර) | නිලධාරීන් සංඛ්‍යාව | 2022.03.31 දිනට ශේෂය | නිරවුල් කරන ලද ණය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| 5ට වැඩි | 14 | 1,309,718 | 77,995 | 1,231,723 |
| 4-5 | - | - | - | - |
| 3-4 | 2 | 290,417 | - | 290,417 |
| 2-3 | 6 | 308,765 | 110,280 | 198,485 |
| 1- 2 | 2 | 292,943 | - | 292,943 |
| 1ට අඩු | 9 | 1,308,603 | 524,318 | 784,285 |
| **එකතුව** | **33** | **3,510,446** | **712,593** | **2,797,853** |

මේ අනුව හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට ගත් ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

I. දීර්ඝ කාලයක සිට පැවතෙන අයකර ගත නොහැකි හිඟ ණය ශේෂ කපා හැරීම සඳහා කමිටුවක් පත්කර අදාළ ණය ශේෂ කපාහැරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.

II. ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4:2:3 ප්‍රකාරව අවුරුදු 5 ට අඩු නිලධාරීන් වෙත ගෙවා ඇති ණය මුදල් හී හිඟ ණය ශේෂ නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා අදාළ අංශ වෙත වාර්තා කර ඇත.

III. ණය නිරවුල් කිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4:6 ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති වෙත දන්වා තිබීම.

IV. අවුරුද්ද ඉක්මවා ඇති, සේවය අතහැර යෑම, වැඩ තහනම් කිරීම යනාදී හේතුන් මත ණය අයකර ගත නොහැකි වූ නිලධාරීන් සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

- නැවත සේවයේ පිහිටුවා ඇත්ද යන්න විමසීම් කිරීම.

| | |
|---|---|
| | • ඇපකරුවන්ගෙන් අය කිරීම.<br>• පෞද්ගලික ලිපිනයන් මගින් එම ණය ශේෂයන් නිරවුල් කරන ලෙස දන්වා යැවීම.<br>• හැඳුනුම්පත් අංක ඇති නිලධාරීන්ගේ තොරතුරු මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් විමසීම.<br>• අදාළ ප්‍රදේශයන්හි පොලීසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරී හරහා විමසීම් කිරීම. |
| දෙවන කොටස | |
| 1. පුරවැසි/සේවාලාභි ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාළව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර නොතිබුණි. මේ වන විට පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කරමින් පවතින අතර, අමාත්‍යාංශයේ සියලු අංශ අතර, සම්බන්ධීකරණයෙන් යුතුව ආයතනික පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සැකසීම, ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් අමාත්‍යාංශයීය සැලසුම් අංශය මගින් සිදු කරමින් පවතී. |

Deepika Buddhadasa
Chief Financial Officer-I
Ministry of Defence
Defence Headquarters Complex
Sri Jayawardenepura
Kotte.

## 2. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

| කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේශ | අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය |
|---|---|
| **පළමු කොටස** | |
| 1. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | විගණනයට ලක් වූ ආයතන කොවිඩ් 19 වසංගත තත්ත්වය පාලනය කිරීමේ රාජකාරි කටයුතුවල නිරතවීම හේතුවෙන් විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ලබා දීමට නොහැකි විය. |
| 2. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | යුද්ධ හමුදාවේ නිලධාරීන් / සෙසුනිලයින් හා සිවිල් කාර්යය මණ්ඩලය ලබාගත් ණය වලින් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.<br><br>**(1) යුද්ධ හමුදා නිලධාරීන් / සෙසුනිලයින්ට අදාළ ණය ශේෂ අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග.**<br><br>(අ) මියගිය අයවළුන්ගේ ණය ශේෂයන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.<br><br>(ආ) ණය ශේෂයන් විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.<br><br>(ඇ) ණය ශේෂයන් විශ්‍රාම වැටුපෙන් වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.<br><br>(ඈ) සේවය අතහැරගොස් ඇති අයවළුන්ට අදාළ ණය ශේෂයන් ඔවුන් සතු ඒකක ඉතිරි කිරීම්, නොගෙවූ හිඟ වැටුප් හා දීමනා හා යුද්ධ හමුදා යහසාධක ඉතිරි කිරීම් හී ශේෂ මගින් අයකර ගැනීමට කටයුතු කිරීම.<br><br>(ඉ) සේවය අතහැරගොස් ඇති අයවළුන්ට අදාළ ණය ශේෂයන් වැන්දඹු හා අනත්දරු දායක මුදලින් අයකර ගැනීමට කටයුතු කිරීම. |

| | |
|---|---|
| | (ඊ) ඉහත ක්‍රියාමාර්ග අනුව අයකර ගැනීමට නොහැකි වූ ණය ශේෂ සඳහා මු.රෙ. අනුව කටයුතු කිරීම.<br><br>**(2) යුද්ධ හමුදා නිලධාරීන් / සෙසුනිලයින්ට අදාළව හිඟ හිටි ණය ශේෂ ඇති නොවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග.**<br><br>(අ) ණය මුදල සඳහා ඇප ඉදිරිපත් කිරීමේදී ණය කරුට පසු විශ්‍රාම යන අයවළුන් පමණක් ඇපකරුවන් ලෙස ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම.<br><br>(ආ) ලබා දී ඇති සම්පූර්ණ ණය මුදලම ණයකරු විශ්‍රාම යාමට ප්‍රථම අයකර ගැනීමට කටයුතු කිරීම.<br><br>**(3) යුද්ධ හමුදා සිවිල් කාර්යය මණ්ඩලයට අදාළ ණය ශේෂ අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග.**<br><br>(අ) මියගිය අයවළුන්ගේ ණය ශේෂයන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සම්බන්ධතාවයෙන් කටයුතු කිරීම.<br><br>(ආ) ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම සහ ණය ශේෂ නිරවුල් කරන ලෙස පළමු සහ අවසාන සිහිකැඳවීම් ලිපි මඟින් ණය කරුවන් දැනුවත් කිරීමට කටයුතු කිරීම.<br><br>(ඇ) ණය ශේෂයන් විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.<br><br>(ඈ) ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස අදාළ පොලිස් ස්ථාන මඟින් දැනුම් දීම.<br><br>(ඉ) අය නොවන ණය ශේෂ අයකර ගැනීම සඳහා යුද්ධ හමුදා නීතිසේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.<br><br>**(4) යුද්ධ හමුදා සිවිල් කාර්යය මණ්ඩලයට අදාළව හිඟ හිටි ණය ශේෂ ඇති නොවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග** |

| | |
|---|---|
| | (අ) ආපදා ණය ලබා දීමේදී යම් සිවිල් සේවකයෙක් ස්ථිර වී වසර 10 ක් ඉක්මවා තිබුණද, වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇතිනම් ණය මුදල් ලබා ගැනීමට ඉල්ලුම් කිරීමේදී සේවය ස්ථිරකර ඇති ඇපකරුවන් සමඟ ණය ගොනුව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.<br><br>(ආ) ස්ථිර වසර 10 ක් නොඉක්ම වූ සිවිල් සේවකයින් සඳහා වැටුප් රහිත, නිවාඩු රහිත ඇපකරුවන් ලබා ගැනීමට කටයුතු කිරීම හා වැටුප් රහිත නිවාඩු බහුලව ලබාගෙන ඇති සිවිල් සේවකයින් ඇපකරුවන් වශයෙන් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම. |
| 3. රැස්කර තිබුණු ආදායම් නියමිත කාලය තුළ නියමානුකූල ලෙස බැහැරකර නොතිබුණි. | ලැබෙන ආදායම් ලද මොහොතේම ආදාළ ආදායම් ශීර්ෂ වෙත ගිණුම්ගත කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත.<br><br>පොදු තැන්පතු ගිණුමේ තැන්පත් කර, රඳවාගෙන ඇති මුදල් රඳවා ගැනීමට පාදක වූ කරුණු මත වරින් වර නිරවුල් කර ඇත.<br><br>අදාළ කාල වකවානුව තුළ වෙනත් ආදායම් ලැබී නොමැත. |
| 4. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු කාර්යසාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත්කර නොතිබුණි. | PFD/RED/COPA/2019/01 හා 2020.01.30 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු ලිපිය අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාවට 2020 වර්ෂයේ විගණකාධිපති වාර්තාව ඇතුළත් කළ යුතුව තිබූ අතර, එම වාර්තාව විගණකාධිපති විසින් 2021.07.06 දින අත්සන්කර යුද්ධ හමුදාව වෙත ඉදිරිපත්කර තිබීම හේතුවෙන් 2020 වර්ෂයේ කාර්යසාධන වර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වන ලදී.<br><br>(1) වාර්ෂික කාර්යසාධන වාර්තාව මුද්‍රණය කිරීමේ කටයුතු සිදුකිරීමේදී යුද්ධ හමුදාව වෙතින් ඉටුකරවාගත නොහැකි සේවාවන් සහ අමුද්‍රව්‍ය මිලදී ගැනීම් බාහිර ආයතනයන් වෙතින් සිදුකරනු ලබයි. එවකට කොවිඩ් 19 වසංගත තත්ත්වය මත රට තුළ පනවා තිබූ නිරෝධායන ඇඳිරි නීතිය හේතුවෙන් මුද්‍රණ කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය |

| | |
|---|---|
| | ප්‍රාදේශීයව මිලදී ගැනීම සහ "KORD Plate" සැකසීම යන සේවාවන් බාහිර ආයතනයන් වෙතින් සිදුකර ගැනීමේ අපහසුතාවයන්ට පත්වන ලදී. ඒ අනුව නිරෝධායන ඇඳිරි නීතිය ඉවත් කිරීමෙන් පසු අදාළ ආයතනයන් සමඟ සම්බන්ධතාවයෙන් අවශ්‍ය අමුද්‍රව්‍ය 2021.10.14 දින ලබා ගැනීමට හැකි වුවද සකසන ලද "KORD Plate" ලබා ගැනීමට හැකි වූයේ 2021.11.08 වන දිනය.<br><br>(2) ඒ අනුව 2020 වර්ෂයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම 2021.11.17 දින අවසන්කර එම වාර්තාවේ පිටපතක් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද අතර, 2021.12.10 වන දින ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලදී. ඒ අනුව කාර්යසාධන වාර්තාවේ මුද්‍රිත පිටපත් 270 ක් සහ සංයුක්ත තැටි 2 ක ප්‍රමාණයක් සකස්කර 2021.12.14 දින පාර්ලිමේන්තු සභානායක කාර්යාලය වෙත භාරදීමට කටයුතුකර ඇති බව දන්වා සිටිනු ලැබේ. |

| දෙවන කොටස | |
|---|---|
| 1. අයවැය චක්‍රලේඛය අනුව අවම වශයෙන් නිමවුම් දර්ශක තුනක් හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. | |
| 2. ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්ය භාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්යදර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි. | BD/CBP/4/1/2/2018 හා 2017.07.25 දිනැති ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛය මඟින් ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව පිළියෙළකර ඇති නිමැවුම් කාර්ය දර්ශක මේ වන විට භාවිතා කරනු ලැබේ. |
| 3. හඳුනාගත් පළමු කාර්යසාධක දර්ශකයේ ලඟාවීම 50%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය. | ඉහත සඳහන් චක්‍රලේඛය ප්‍රකාරව යුද්ධ හමුදාවට අදාළ නිමැවුම් කාර්ය දර්ශක (KPIs) හඳුනාගෙන ලේඛනගත කිරීම සඳහා මණ්ඩලයක් පත් කරන ලද අතර, එම මණ්ඩලයේ නිගමන අනුව |

| | |
|---|---|
| 4. හඳුනාගත් දෙවන කාර්යසාධක දර්ශකයේ ලඟාවීම 50% ට වඩා අඩු මට්ටමක විය. | ත්‍රිවිධ හමුදාව සඳහා පොදු නිමැවුම් කාර්ය දර්ශක පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත. |
| 5. හඳුනාගත් තුන්වන කාර්යසාධක දර්ශකයේ ලඟාවීම 50% ට වඩා අඩු මට්ටමක විය. | |

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

## 3. ශ්‍රී ලංකා නාවික හමුදාව

| කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේශ | අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය |
|---|---|
| **පළමු කොටස** | |
| 1. 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පලවෙනි මුරපදය ගණකාධිකාරි හෝ අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි. | නියමිත ක්‍රියාපටිපාටියට අනුව වර්තමානයේ කටයුතු සිදු කරමින් පවතී. |
| 2. 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ, පලමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි. | නියමිත ක්‍රියාපටිපාටියට අනුව වර්තමානයේ කටයුතු සිදු කරමින් පවතී. |
| 3. විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 02 ක් වත් පවත්වා නොතිබුණි. | 2020 හා 2021 වර්ෂ තුල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතු කොටගෙන අවම වශයෙන් අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 02 ක් වත් පැවැත්වීමට නොහැකි වුවද, මේ වන විට අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03 ක් පවත්වා ඇති අතර, 2022 වර්ෂයට අදාළ සිව්වන රැස්වීම් වාරය 2023 ජනවාරි මස 24 වන දින පැවැත්වීමට සැලසුම් කර ඇත. |
| 4. වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිග ණය ශේෂ පැවතුණි. | අත්තිකාරම් 'බී' ගිණුමේ පවතින හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>I. අත්තිකාරම් 'බී' ගිණුම වෙතින් ලබාදෙනු ලබන සියළුම ණය මුදල් සඳහා ඇපකරුවෙකු ලබා ගැනීම අනිවාර්ය කර ඇත. |

| | |
|---|---|
| | II. නාවික සේවයෙන් විශ්‍රාම යාමේදී / සේවයෙන් ඉවත්ව යාමේදී ඔවුන් විසින් අත්තිකාරම් 'බී' ගිණුමෙන් ලබාගෙන ඇති උත්සව හා විශේෂ අත්තිකාරම් මුදලෙහි හිඟ ශේෂයන් ගෙවා නිරවුල් කිරීමෙන් අනතුරුව (රු.10,000.00 ට අඩු ශේෂයන් බැවින් ) නිම සේවා ගැන්වීමට කටයුතු කිරීම.<br>III. කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවීමට ඇති වර්ෂ 05 කට වැඩි ණය ශේෂයන්හි 2020 වර්ෂයේ පැවති රු.2,755,630.95 ක ශේෂය 2022 නොවැම්බර් මස 30 වන දින වන විට රු. 763,154.33 ක් දක්වා අඩු කරගෙන ඇත. ඒ අනුව මෙම කාල පරිච්ඡේදය තුල රු. 1,992,476.62 ක මුදලක් නිරවුල් කර ඇත. |
| 5. රැස්කර තිබූ ආදායම් නියමිත කාලය තුල නියමාණුකූල ලෙස බැහැර කර නොතිබුණි. | මේ වන විට රැස් කරන ලද ආදායම් ක්‍රමාණුකූලව නියමිත ආදායම් ශීර්ෂ වෙත බැර කිරීමට කටයුතු කරමින් පවතී. |
| **දෙවන කොටස** | |
| 1. මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබාදීම / ලබා නොදීම සම්බන්ධව විස්තර ඇතුලත් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මහජනයා වෙත තොරතුරු ලබාදීම සබැදි විස්තර ඇතුලත් ලේඛණයක් වර්තමානය වන විට පවත්වාගෙන යනු ලබයි. |
| 2. ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛණගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි. | තොරතුරු ලබා නොදීම හා සැබැදි පැමිණිලි ලේඛණගත කර වර්තමානය වන විට පවත්වාගෙන යනු ලබයි. |
| 3. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි | www.navy.lk අප අමතන්න තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් විමසීම info@navy.lk ඊ මේල් මාර්ගයෙන් දැනටත් පැමිණිලි හෝ |

| | |
|---|---|
| හෝ ප්‍රශංසා සටහන් කිරීමට අවස්ථා සලසා දී නොතිබුණි. | ප්‍රසංශා සටහන් කිරීමට වර්තමානයේ අවස්ථාව සලසා දී ඇත. |
| 4. 2018 අප්‍රේල් මස 27 වන දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධිවිධානය අනුව ඉටුකල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයින් දෙදෙනා පිළිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි. | මේ වන විට නිලධාරියෙකු පත්කර අදාළ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර ඇත. |
| 5. අයවැය චක්‍රලේඛය අනුව අවම වශයෙන් නිමවුම් දර්ශක තුනක් හඳුනාගෙන ලේඛන ගත කර නොතිබුණි. | ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව නාවික හමුදාව විසින් 2022 ජූලි මස 04 වන දිනැති අංක UK/01/2022(I) දරණ ලිපිය මගින් අනුමත කර ඇත. |
| 6. ආයතනය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි. | ආයතන කාර්යය භාරය හා සම්බන්ධිත ප්‍රධාන කාර්ය දර්ශක 17 ක් ඉදිරිපත් කර ඇති අතර, එම කාර්ය දර්ශක හඳුනා ගැනීමට අධ්‍යයන මණ්ඩලයක් පත්කර එමගින් නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව එම අධ්‍යයන මණ්ඩල වාර්තාවට අනුව නාවික හමුදාවට අයත් වන ප්‍රධාන කාර්ය දර්ශක 14 ක් පමණක් මේ වන විට හඳුනාගෙන ඇත. |

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරී - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

## 4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව

| කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේශ | අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය |
|---|---|
| **පළමු කොටස** | |
| 1. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම. | 2020 මුල්‍ය වර්ෂයට අදාළව විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ වැඩි විගණන විමසුම් ගණනක් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමට තිබූ කාල රාමුව එනම් මසක් ඇතුලතම පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.<br><br>කෙසේ නමුත්, සුළු විගණන විමසුම් ප්‍රමාණයක් සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා දීමට නොහැකි වූ අවස්ථා ඇත. ඊට හේතූන් ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දීප ව්‍යාප්තව පවතින විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු මඟින් සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූලස්ථානයේ පවතින අධ්‍යක්ෂක මණ්ඩල / අංශයන් මඟින් ඇතම් විගණකාධිපති විගණන විමසුම් සඳහා පැහැදිලි කිරීම් ලබා ගැනීමට සිදු වී ඇති අතර, එවකට පැවති කොරෝනා වසංගත තත්ත්වය මත ද විගණන විමසුම් සඳහා මසක් ඇතුලත පිළිතුරු ලබාදීමට ප්‍රමාද වී ඇත.<br><br>වර්තමානය වන විට හැකි සෑම අවස්ථාවකම මසක් ඇතුළත විගණකාධිපති විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට කටයුතු කර ඇත. |
| 2. වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම. | අදාළ වර්ෂය තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත බොහෝ කටයුතු විවිධ සීමාවන් යටතේ සිදුවූ නිසාත්,එම කාලය තුළ අපහරණ කටයුතු සඳහා නම් කල බාහිර ආයතන වල සාමාජිකයින් හට පැමිණීමට තිබූ සීමාවන් / අපහසුතා නිසා එම කටයුතු එම වර්ෂය තුල ප්‍රමාද වී ඇත.<br><br>තවද, වාහන අපහරණ කටයුතු සිදු කරනුයේ විවිධ කඳවුරු තුළ ඇති අළුත්වැඩියා කිරීමට අපහසු වාහන කටුනායක කඳවුරේ යන්ත්‍ර ප්‍රවාහන අළුත්වැඩියා හා ප්‍රතිසංස්කරණය කිරීමේ පක්ෂාංගය වෙත භාර දී එහිදී අළුත්වැඩියා කිරීමේ හැකියාව සහ ආර්ථිකමය ඵලදායීතාවයන් පිළිබදව අධීක්ෂණයකින් පසුවයි. එම කටයුතු සඳහා |

| | |
|---|---|
| | යම් සැලකිය යුතු කාලයක් ගතවේ.<br><br>එමෙන්ම, එම 2020 වර්ෂයට අදාළ අපහරණ කටයුතු මේ වන විටත් අවසන්ව ඇති අතර, ඊට පසුව හඳුනාගත් වාහන 61 ක් සහ වාහන 63 ක් සඳහා වන අපහරණ මණ්ඩල දෙකක කටයුතු මේ වන විටත් අවසන් අදියරේ පවතී.<br><br>එමෙන්ම, වාහන අපහරණය කිරීමේ කටයුතු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සැපයුම් අධ්‍යක්ෂකය මඟින් පරිපාලන අධ්‍යක්ෂකය, සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය, සැපයුම් හා නඩත්තු කිරීමේ ඩිපෝව හා ආරක්ෂක අමාත්‍යාංශය සමඟ අනුබද්ධව සිදුකරනු ලබන අතර, විශ්‍රාම යාම වැනි හේතූන් මත සමීක්ෂණ මණ්ඩල සඳහා නම් කරන ලද සාමාජිකයින් වෙනස් කිරීමට සිදු වීම වැනි කරුණු හේතුවෙන් අපහරණ ක්‍රියාවලිය ප්‍රමාදවීම සිදුවන අතර, ඉදිරියේදී එම කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.<br><br>තවද, දී ඇති උපදෙස් අනුව අපහරණ කටයුතු හැකිතාක් කඩිනමින් සිදුකිරීමට අවශ්‍ය අභ්‍යන්තර පියවර ගෙන ඇත. |
| 3. මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර තිබීම. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව ජාතික ආරක්ෂාව සම්බන්ධව කාර්යයන් ඉටුකරන ආයතනයක් වන අතර, මු.රෙ.94(1) ප්‍රකාරව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් සිදු නොකර සිටීමට හැකි සෑම විටම කටයුතු කරනු ලබයි. එහෙත් ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් මූලිකත්වය ගෙන කටයුතු කිරීමේදී ඉල්ලුම් කරන ලද තරම් ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබෙන අවස්ථාවන් වලදී වුවද එනම් ගුවන් යානා, රේඩාර් උපකරණ, වාහන සහ අනෙකුත් උපකරණ සේවා තත්ත්වයෙන් එනම් සැමවිටම ක්‍රියාකාරී තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතුය. එම අවස්ථාවන් වලදී ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් කිරීම හැර වෙනත් විකල්පයක් නැත. කෙසේ වෙතත්, කිසිම අවස්ථාවකදී මුදල් වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා ගෙවීම් සිදු නොකෙරේ. තවද, මෙවැනි අවස්ථා ඇති වන්නේ විශේෂයෙන්ම මූල්‍ය වසර අවසානයේ බැවින්ද බොහෝවිට, එම භාණ්ඩ හා සේවාවන් ලබා ගන්නේ වසර අවසානයේ බැවින් හෝ ඊලඟ වර්ෂයේදී බැවින් සැපයුම්කරුවන්ට බිල්පත් නිරවුල් කිරීමේදී ගැටළුවක් පැන නොනඟී. |

| | |
|---|---|
| 4. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | අ. **<u>සේවා අංශයේ නියුතු නිලධාරීන්ගේ සහ සෙසු නිලයන්ගේ හිඟ ණය අයකර ගැනීමේ ප්‍රගතිය</u>**<br><br>(1) රජයේ අත්තිකාරම් 'බී' ගිණුමේ 2020 දෙසැම්බර් මස 31 වන දිනට වර්ෂයට වඩා පැවති හිඟ ණය මුදල් සියල්ලම මේ වන විට නිරවුල් කර ඇත. එම විස්තරය "ඇමුණුම - 01" මඟින් ඉදිරිපත් කර ඇත.<br><br>(2) තවද, වර්තමානයේ මෙවැනි හිඟ ණය ශේෂ ඇති වීම වැළැක්වීමට සේවා අංශයේ නිලධාරීන් සහ සෙසු නිලයන් සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග "ඇමුණුම - 02" මඟින් ඉදිරිපත් කර ඇත.<br><br>ආ. **<u>සිවිල් අංශයේ නියුතු නිලධාරීන්ගේ හිඟ ණය අයකර ගැනීමේ ප්‍රගතිය.</u>**<br><br>වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ අයකර ගනිමින් පවතී. මේ සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් මස 31 වන දිනට කාල විශ්ලේෂණ ප්‍රගතිය "ඇමුණුම - 03" ලෙස ද, හිඟ ණය ශේෂ අය කරගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රගතිය "ඇමුණුම - 04" ලෙස ද ඉදිරිපත් කර ඇත. |
| 5. අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ ගලපා වෙනස්කම් මාසිකව සසඳා නොතිබුණි. | භාණ්ඩාගාර මාර්ගෝපදේශ අංක 04 උපදෙස් පරිදි අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් සමඟ ගලපා වෙනස්කම් මාසිකව සංසන්දනය කරන අතර, අදාළ වාර්තා ත්‍රෛමාසිකව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. කෙසේ වුවද, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙතින් ලද උපදෙස් පරිදි 2020 නොවැම්බර් මස සිට සංසන්දනය කරන වෙනස්කම් වලට අදාළ වාර්තා මාසිකව ඉදිරිපත් කරනු ලැබේ. |
| 6. කාර්යය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබීම. | සිවිල් හා සේවා කාර්යය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්යය පැවරුම් නියමිත පරිදි සකස් කර සියළු දෙනා වෙත ලබා දී ඇත. |

<table>
<tr>
<td>7. 2017 සැප්තැම්බර් මස 20 දිනැති 2017 අංක 4 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්යය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර නොතිබුණි..</td>
<td>
අ. <u>සේවා අංශය</u>
2017 සැප්තැම්බර් මස 20 වන දිනැති 2017 අංක 4 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛ ප්‍රකාරව සෑම කාර්තුවක් අවසානයෙහිම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත සේවා අංශයේ කාර්යය මණ්ඩල තොරතුරු යොමු කරන ලද අතර, එම යොමු කිරීම් වලට අදාළ පැහැදිලි කිරීම් පහත පරිදි වේ.
<table>
<tr><th>වර්ෂය</th><th>යොමුව</th><th>යොමු කළ දිනය</th></tr>
<tr><td>2020 පළමු කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සංවිධාන</td><td>2020 මැයි මස 11 වැනි දින</td></tr>
<tr><td>2020 දෙවන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සංවිධාන</td><td>2020 ජූලි මස 08 වැනි දින</td></tr>
<tr><td>2020 තෙවන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සංවිධාන</td><td>2020 දෙසැම්බර් මස 03 වන දින</td></tr>
<tr><td>2020 සිව්වන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සංවිධාන</td><td>2021 ජනවාරි මස 22 වන දින</td></tr>
</table>
ආ. <u>සිවිල් අංශය</u>
කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2017 අනුව කාර්තුමය වශයෙන් සිවිල් කාර්යය මණ්ඩල වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවද, 2020 වර්ෂයේ මාර්තු මාසයේ හටගත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම කාර්යාලය පවත්වාගෙන යනු ලබන කඳවුරු පරිශ්‍රයන් තුළට බාහිර පදිංචි කාර්යය මණ්ඩලය කැඳවීම සීමා කිරීමත්, ඉන් අනතුරුව වරින් වර කොවිඩ් අසාදිත සංඛ්‍යාව වර්ධනය වීමෙන් පසුව කාර්යාල මණ්ඩලය චක්‍රීය ක්‍රමයට කැඳවීමත්, කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි පැවැත්වීම සිදු නොවීමත් හේතුවෙන් එම වාර්තා නිසි පරිදි යොමු කිරීම සිදුකර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. කඳවුරු ගත සේවා කාර්යය මණ්ඩලය හා බැහැර පදිංචි කාර්යය මණ්ඩලය එක්ව රාජකාරියේ යෙදීම ආරම්භ වීමෙන් අනතුරුව ද ඇතැම් පළාත් හා දිස්ත්‍රික්කයන්හි ද පැවති වසංගත තත්ත්වයේ ස්වභාවය අනුව කාර්යය මණ්ඩල වාර්තා ලබා ගැනීමේදී යම් අපහසුතා ඇති වූ බැවින් එම වාර්තා යොමු කිරීම සිදුවී නැත. කෙසේ වුවත් වර්තමානය වන
</td>
</tr>
</table>

<table>
<tr><td></td><td>විට වාර්තා යොමු කිරීම නිසි පරිදි සිදු කර ඇත. ඊට අදාළ තොරතුරු පහත පරිදි වේ.
<table>
<tr><th>වර්ෂය</th><th>යොමුව</th><th>යොමු කළ දිනය</th></tr>
<tr><td>2022 පළමු කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/සිවිල්/806/411/ පීසී</td><td>2022 අප්‍රේල් මස 20 වැනි දින</td></tr>
<tr><td>2022 දෙවන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/සිවිල්/806/411/ පීසී</td><td>2022 ජුලි මස 11 වැනි දින</td></tr>
<tr><td>2022 තෙවන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/සිවිල්/806/411/ පීසී</td><td>2022 ඔක්තෝබර් මස 31 වැනි දින</td></tr>
<tr><td>2022 සිව්වන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/සිවිල්/806/411/ පීසී</td><td>2023 ජනවාරි මස 12 වැනි දින</td></tr>
</table></td></tr>
<tr><td colspan="2">දෙවන කොටස</td></tr>
<tr><td>1. විගණකාධිපතිවරයා විසින් ඡේද වලින් පෙන්වා තිබු අඩුපාඩු /දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.</td><td>ශ්‍රී ලංකා ගුවන් හමුදාව සම්බන්ධයෙන් 2020 මූල්‍ය වර්ෂය සඳහා අදාළ වන කාර්යසාධන ඇගයීම ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් පෙන්වා දුන් බොහෝමයක් අඩුපාඩු / දුර්වලතා එම කාළ රාමුව තුලදීම නිවැරදි කළ අතර, ඉදිරියේදී එම අඩුපාඩු මගහරවා ගැනීමට හා නැවත ඇති නොවන පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, ඒ සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට හා පවත්නා අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීමට ඒ ඒ අඩුපාඩු / දුර්වලතා ඉස්මතු වූ අංශයන් වෙත දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර, කාර්තුමය වශයෙන් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝග හා තීරණ මගින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.</td></tr>
</table>

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

## 5. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

| කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේශ | අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය |
|---|---|
| පළමු කොටස | |
| 1. ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව පහත වත්කම් කාණ්ඩ වලින් සමන්විත වේ.<br><br>I. ඉඩම්<br>II. ගොඩනැගිලි<br>III. කාර්යාල උපකරණ හා වෙනත් යන්ත්‍ර උපකරණ<br>IV. ප්‍රවාහන උපකරණ<br>V. ජීව විද්‍යාත්මක වත්කම්<br><br>එකී වත්කම් සම්බන්ධයෙන් වන භෞතික වත්කම් ශේෂය, ලේඛනගත වත්කම් ශේෂය සමඟ නොසැසඳීම්, දෙපාර්තමේන්තුව හඳුනාගෙන තිබූ අතර, අදාළ ගිණුම්ගත කර නොතිබූ වත්කම් සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.<br><br>**I/II.** ඉඩම් හා ගොඩනැගිලි<br>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සතුව පැවති ඉඩම් හා ගොඩනැගිලි අතුරින් 2021.12.31 දින වන විට තක්සේරු කර තිබූ ඉඩම් (61410) හා ගොඩනැගිලි (61112) වටිනාකම් පිළිවෙලින් රු.59,659,828.64 ක් හා රු.284,669,000.00 ක් වශයෙන් 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන තුළින් ගිණුම්ගත කර හෙළිදරව් කරන ලදී.<br><br>පහත සාරාංශ කර දක්වා ඇති පරිදි තවදුරටත් අයිතිය දෙපාර්තමේන්තුවට පැවරී ඇති, හඳුනා ගැනීමට තිබූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධව තක්සේරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | |
|---|---|
| ඔප්පු සහිතව පවරා ගෙන ඇති ඉඩම් සංඛ්‍යාව | 2 |
| බලපත්‍ර සහිතව විධිමත්ව පවරා ගෙන ඇති ඉඩම් සංඛ්‍යාව | 27 |
| කුලී, බදු පදනම මත පවරා ගෙන ඇති ඉඩම් සංඛ්‍යාව | 19 |
| පවරාගත හැකි යැයි උපකල්පනය කර ලිපි යොමු කළ සංඛ්‍යාව | 195 |
| පවරාගත හැකි යැයි පරීක්ෂා කරමින් පවතින ඉඩම් හා ගොඩනැඟිලි සංඛ්‍යාව | 159 |
| තාවකාලිකව පරිහරණය කරනු ලබන ඉඩම් හා ගොඩනැඟිලි සංඛ්‍යාව | 153 |
| මුළු කාර්යාල ස්ථාන සංඛ්‍යාව | 555 |

**III. කාර්යාල උපකරණ හා වෙනත් යන්ත්‍ර උපකරණ**

ඉහත වත්කම් (6112203) භාණ්ඩයට අදාළ වත්කම්, 2022.12.31 දින දක්වා ලේඛනගත කර ඇති අතර, සමස්ත ශේෂය රු.925,649,597.77 ක් වේ. එම වත්කම් හඳුනාගෙන ඇතත්, සිගාස් වැඩසටහනෙහි වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමේදී ස්ථානීය වශයෙන් නිවැරදිව ලේඛනගත නොවීම සම්බන්ධයෙන් විගණනය මඟින් පෙන්වා දී ඇති අතර, ඒ අනුව බලකා මට්ටමින් තක්සේරු කමිටු පත්කර, තක්සේරු වාර්තා ලබා ගනිමින් එකී වත්කම් නිවැරදිව ස්ථානීය වශයෙන් ගිණුම්ගත කර අවසන් කිරීමටත් අත්පත් කරගනු ලබන වත්කම් ස්ථානීය වශයෙන් නිවැරදිව ගිණුම්ගත කිරීමටත් කටයුතු යොදා ඇත.

**IV. ප්‍රවාහන උපකරණ - (61121)**

රක්ෂණ ආවරණයෙහි තක්සේරු වාර්තා පදනම් කරගනිමින් 2022.12.31 දින වන විට ගිණුම්ගත කර අවසන් කර ඇත. සමස්ත වත්කම් ශේෂය රු.783,924,646.00 ක් වේ.

**V. ජීව විද්‍යාත්මක වත්කම්**

2021.12.31 වන දිනට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සතුව පැවති ජීව විද්‍යාත්මක වත්කම් නිවැරදිව ගිණුම්ගත කර අවසන් කර ඇති අතර, රු.60,711,700.00 ක වත්කම් 2021

<table>
<tr><td></td><td>මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කරන ලදී.<br><br>තවද, උක්ත විගණන නිරීක්ෂණයන් ඉදිරියේදී ඇති වීම වළක්වා ගැනීම සඳහා රජයේ වත්කම් හඳුනාගැනීම, අත්පත් කර ගැනීම, ලේඛන නඩත්තු කිරීම හා අදාළ අධිකාරීන්ට තොරතුරු වාර්තා කිරීම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථානයේ අධ්‍යක්ෂ පාලන යටතේ "වත්කම් කළමනාකරණ ඒකකය" ක් පිහිටුවා ඇත. දෙපාර්තමේන්තු වත්කම් කළමනාකරණය සම්බන්ධව බලකා නිවැරදි ක්‍රමවේදයට මෙහෙයවීම හා මූලස්ථානය අතර සම්බන්ධීකරණය සිදුකිරීමට එම ඒකකයට වගකීම් පවරා ඇත.</td></tr>
<tr><td>2. හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.</td><td>2020 වර්ෂය අවසන් වන විට හානි පිළිබඳ ලේඛනයෙහි සිද්ධි 3 ක් පමණක් ඇතුළත් කර තිබු අතර, ඒවා පිළිබඳව ද අවසන් තීරණයකට එළඹ නොතිබුණි.<br><br>ඊට හේතුව, විමසුම යොමුකර ඇති 2020 වර්ෂය අවසන් වන විටත් හානි හා පාඩු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය බලකා මට්ටමට ප්‍රාමාණිකව දැනුවත් කිරීම් සිදුව නොතිබීමයි. නමුත් එකී සන්නිවේදන ලුහුඬුතාව නිවැරදි ලෙස හඳුනාගනිමින්, හානි හා පාඩු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු නිවැරදි පිළිවෙත කවරේද යන්න පිළිබඳ 06/2022 අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කර, හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යෑමේ වගකීම අධ්‍යක්ෂ (පාලන) වෙත පවරන ලදි.<br><br>ඒ අනුව, 2022.12.31 දින වන විට හානි පිළිබඳ ලේඛනය විධිමත්ව හා පූර්ණ වශයෙන් යාවත්කාලීන කිරීමට හැකි වී ඇත. සාරාංශය පහත පරිදි වේ.<br><br>
<table>
<tr><td>2022.12.31 දිනට හඳුනාගනු ලැබ ඇති සිදුවීම් සංඛ්‍යාව</td><td>59</td></tr>
<tr><td>ඒ අතුරින්, විධිමත්ව අවසන් කර ඇති සිදුවීම් සංඛ්‍යාව</td><td>39</td></tr>
<tr><td>ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා මණ්ඩල පත්කර වගකීම් පවරා ඇති සිදුවීම් සංඛ්‍යාව</td><td>20</td></tr>
</table>
</td></tr>
</table>

| | |
|---|---|
| 3. 2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පැවති ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් වැටුප් සැකසීම, අත්‍යවශ්‍ය සේවා සඳහා ගෙවීම් කිරීම ආදී කාර්යාලය තුල පමණක් ඉටුකල හැකි රාජකාරීන් හැරෙන්නට අනිකුත් සාමාන්‍ය රාජකාරීන් නිවසේ සිට සිදු කිරීමට ප්‍රමුඛතාවය ලබාදී තිබුණි. එබැවින් විමසුමේ පෙන්වා දී ඇති පරිදි අදාළ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ නමුත් 2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී එකී සියළු වත්කම් මිලදී ගැනීම් හා අපහරණයන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.<br><br>තවද, 2022.12.31 දින දක්වා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත.<br><br>2023 වර්ෂයේ සිට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වත්කම් වාර්තා කිරීමේ රාජකාරියෙහි වගකීම ඉහත සඳහන් "වත්කම් කළමනාකරණ ඒකකය" වෙත පවරා අදාළ කටයුතු විධිමත් කර ඇත. |
| 4. 2016.03.31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පෙර වර්ෂවල අතපසු වී ඇති භාණ්ඩ සමීක්ෂණයන් ද, අපහරණයන්ද ආවරණය වන පරිදි 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කරන ලදී. අද වන විට සියළු බලකා හා මූලස්ථානවල ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. |
| 5. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි. | 2020 වර්ෂයේ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාලවකවානුවල සිදුකර නොමැත. නමුත් 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදුකර අවසන් කර ඇති අතර, එහිදී අතිරික්තතා හා ඌනතා ඇතිවී නොමැති බව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් අනාවරණය වී ඇත. එබැවින් 2020 කළයුතු භාණ්ඩ සමීක්ෂණය 2022 වර්ෂයේ සිදුකර ඇති බව කාරුණිකව දන්වමි. |
| 6. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය වෙතින් මූලස්ථානය සතු සියළුම වාහනවලට අදාළව 2020 වර්ෂයේ ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කර විගණකාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇතත්, ඔවුන් විසින් එකී සටහන් විගණනය සඳහා පසුව ලබා |

<table>
<tr><td></td><td>ගන්නා බවත්, එතෙක් සුරක්ෂිතව තබා ගන්නා ලෙසත් උපදෙස් ලබාදී ඇත. එකී වාර්තා මේ වන විටත් අවශ්‍ය ඕනෑම විටකදී විගණනයට ඉදිරිපත් කිරීම සඳහා ලේඛනාගාරයෙහි සුරක්ෂිතව ගබඩා කර ඇත. තවද, මේ වන විට ධාවන සටහන්පත් හා සාරාංශ මාසිකව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.</td></tr>
<tr><td>7. වාහනයක් ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.</td><td>2020 වර්ෂයේ දීපව්‍යාප්තව පැවති දරුණු කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අදාළ ක්‍රියාවලිය සිදු කිරීමට ප්‍රමාද වී ඇතත්, විගණන කාලසීමාව අවසානයේදී එම වාහන අපහරණය කර වෙන්දේසි කටයුතු සිදුකර අදාළ නිරීක්ෂණය පූර්ණ කර ඇත.</td></tr>
<tr><td>8. නියමිත දිනයට බැංකු සැසඳුම් පිළියෙළ කර නොතිබුණි.</td><td>පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනට බැංකු සැසඳුම් වාර්තා පිළියෙළ කර නොතිබුණි. නමුත් වර්තමානයේ මසක් අවසන් වී එළඹෙන මස 15 වන දිනට පෙර බැංකු සැසඳුම් සකස් කිරීමට කටයුතු කර ඇත. තවද, එවකට බැංකු ප්‍රකාශවල තිබූ අඩුපාඩු වර්තමානයේ නිවැරදි වී ඇත.</td></tr>
<tr><td>9. බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.</td><td>බැංකු සැසඳුම් වලින් අනාවරණය වූ ගැලපුම් කළයුතු ශේෂ 2021 වර්ෂයේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව ගැලපුම් සිදුකර ඇති බව කාරුණිකව දන්වමි.</td></tr>
<tr><td>10. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.</td><td>
<table>
<tr><th>විස්තරය</th><th>2020 වර්ෂයේ සැසඳුම් වාර්තාවේ වර්ෂ 01-02 අතර හිඟ හිටි ණය ශේෂය</th><th>2020 වර්ෂයේ සැසඳුම් වාර්තාවේ වර්ෂ 02-03 අතර හිඟ හිටි ණය ශේෂය</th><th>එකතුව</th></tr>
<tr><td>2020/12/31 දිනට ශේෂය</td><td>4,803,012.48</td><td>5,678,219.69</td><td>10,481,232.17</td></tr>
<tr><td>2022/12/31 දිනට නිරවුල් කර ඇති මුදල</td><td>2,283,529.78</td><td>2,667,530.74</td><td>4,951,060.52</td></tr>
<tr><td>අයවීමට ඇති ශේෂය</td><td colspan="2"></td><td>5,530,171.65</td></tr>
</table>
</td></tr>
</table>

| | |
|---|---|
| | 2020 සැසඳුම් වාර්තාවේ ඇතුළත් ඉහත ශේෂයන් සේවය හැරගිය නිලධාරින්ගෙන් අයවිය යුතු අත්තිකාරම් ණය ශේෂ බැවින්, ඒවා අයකර ගැනීම ප්‍රායෝගිකව අසීරු තත්ත්වයක පවතී. නමුත් 2020 එකී ශේෂ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට හා ප්‍රතිපූර්ණ ශක්‍යතාව සොයා බැලීම සඳහා කමිටුවක් පත්කර ඇත. එම කමිටුව විසින් අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. |
| 11. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු කාර්යසාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ ප්‍රමාදය සඳහා පහත කරුණු හේතුපාදක වී ඇත.<br>කාර්යාසාධන වාර්තාව කෙටුම්පත්කරණය විෂයභාර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමිත කාලරාමුව තුල අවසන් කර 2021.04.21 දින විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. කාර්යාසාධන වාර්තාවට ඇතුලත් විය යුතු 2020 විගණකාධිපති අවසන් වාර්තාව ඒ වන විටත් මෙම දෙපාර්තමේන්තුවට ලැබී නොතිබූ හෙයින්, විගණකාධිපති කෙටුම්පත් වාර්තාව සමඟ 2021.07.15 දින පාර්ලිමේන්තු සභානායක ලේකම් කාර්යාලයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. නමුත්, කාර්යසාධන වාර්තාව තුල අවසන් විගණකාධිපති වාර්තාව ඇතුළත් විය යුතු බවට දන්වමින් එම කාර්යාලය විසින් වාර්තාව භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත. එකී 2020 විගණකාධිපති අවසන් වාර්තාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට ලැබී ඇත්තේ 2021.07.02 දින වන අතර, එදිනට වාර්තාව ලබාදිය යුතු අවසන් දිනට වඩා මසක කාලයක් ගත වී ඇත. ඒ අනුව, ඒ වන විටත් මුද්‍රණය කර තිබූ කාර්යසාධන වාර්තා නැවත අදාළ මුද්‍රණකරු වෙත යවා විගණකාධිපති වාර්තා කොටස මුද්‍රණය කර, එය මුල් වාර්තාවට එකතු කර නැවත පොත් බැඳීමට අමතර කාලයක් ගත වීම.<br><br>මෙකී කාල සීමාවේදී දිවයින උග්‍ර කොවිඩ් වසංගත බලපෑමට හසුව තිබූ කාලසීමාව වූ හෙයින්, මුද්‍රණකරුවන් සොයාගැනීම, ප්‍රසම්පාදනයට හා අනපේක්ෂිත වැඩි කාලයක් ගත වීම. මුද්‍රණ කොන්ත්‍රාත්තුව භාරදුන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය මුද්‍රණ ආයතනයට ද එකී කොවිඩ් බලපෑම මත ගිවිසුම් ගත දිනට වඩා මුද්‍රණය නිම කිරීමට අනපේක්ෂිත අමතර කාලයක් ගතවීම.<br><br>අංක 2238/19 හා 2021.07.29 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව එතෙක් අයිතිව තිබූ මහජන |

| | |
|---|---|
| | ආරක්ෂක අමාත්‍යාංශයෙන් මුදවා, නැවත වරක් ආරක්ෂක අමාත්‍යාංශයට පවරන ලදි. එබැවින් ඒ වන විටත් මහජන ආරක්ෂක ගරු අමාත්‍යතුමාගේ අත්සනින් පාර්ලිමේන්තුවට භාර දී තිබූ කාර්යසාධන වාර්තා නැවත වරක් ගරු ආරක්ෂක අමාත්‍යතුමාගේ අත්සනින් යොමු කරන ලෙස සභානායක ලේකම් කාර්යාලය මඟින් 2021.08.05 දින දන්වන ලද අතර, එතැන් සිට එම කාර්යය සඳහා මාස 02 ක පමණ අමතර කාලයක් වැය වීම. කෙසේවෙතත්, 2021.11.16 දින වාර්තාව ගරු ආරක්ෂක අමාත්‍යතුමාගේ අත්සනින් පාර්ලිමේන්තු සභානායක ලේකම් කාර්යාලයට භාර දී ඇත. |
| 12. 2017.09.20 දිනැති 2017 අංක 4 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්යය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර නොතිබුණි. | 2020 වර්ෂයේ මාර්තු සිට කොවිඩ් වසංගත බලපෑම මත වරින් වර පැන වූ ඇඳිරි නීතිය, කාර්යය මණ්ඩල කැඳවීම් සීමා කිරීම් ආදී සීමාවන් හේතුවෙන් එකී කටයුත්ත නිසි ලෙස නියමිත දිනට ඉටු වී නැතත්, වර්ෂ අවසානයට පෙර අදාළ දත්ත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.<br><br>2021 සිව්වන කාර්තුවේ සිට අදාළ රාජකාරිය නියමිත දිනට ඉටුකර ඇත. |
| **දෙවන කොටස** | |
| 1. පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| 2. ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| 3. රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මානව සම්පත් සැලැස්ම ලෙසට නම් කරන ලද සැලැස්මක් පිළියෙල කර නොතිබූ නමුත්, 2020 වර්ෂය වෙනුවෙන් වාර්ෂික පුහුණු සැලැස්මක් පිළියෙල කර තිබිණි. එම සැලැස්ම තුළ 2020 වාර්ෂික ඇස්තමේන්තුවෙන් පුහුණු වැය විෂයට වෙන් වූ ප්‍රතිපාදනය ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කරමින් 36,000 කට ආසන්න සිවිල් |

| | |
|---|---|
| | ආරක්ෂක සාමාජිකයන්ගෙන් 50% කට ආසන්න උපරිම පිරිසක් ආවරණය වන පරිදි පුහුණු ලබා දී ඇත.<br>2020 වර්ෂයේ පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කර තිබූ පුහුණු වැඩසටහන් ද අවලංගු කර දැමීමට සිදු වූ අතර, එහෙයින් උක්ත සඳහන් පුහුණුලාභී ප්‍රතිශතය අවප්‍රමාණය වූ බව කාරුණිකව දන්වා සිටමි. එසේ නමුත්, 2021/2022 වර්ෂයන්හි දී එකී ප්‍රතිශතය ඉහළ නැංවීමට කටයුතු කර ඇත. |
| 4. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි. | මේ වන විට විධිමත් පරිදි මානව සම්පත් සැලැස්ම සැකසීමට හා ඒ අනුව එක් එක් නිලධාරියාට අවම වශයෙන් චක්‍රලේඛිත පැය 12 ක පුහුණුව හෝ ලබාදීමට අධ්‍යක්ෂ පුහුණු වෙත වගකීම් පවරා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| 5. සමස්ථ කාර්යමණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි. | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සියළුම සාමාජිකයන් හට විධිමත් පරිදි රාජකාරි වැඩ ලැයිස්තු පවරා ඇත. තවද, එමඟින් ඔවුන් යම්තාක් දුරකට රාජකාරිමය වශයෙන් ගිවිසුමකට ලක්කර ඇත.<br>කෙසේ වෙතත්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අංක 06/2022 හා 2022.05.06 දිනැති අභ්‍යයන්තර චක්‍රලේඛය මඟින් සිවිල් කාර්යය මණ්ඩලය ගිවිසුම්ගත කිරීමේ වගකීම අධ්‍යක්ෂ (පාලන) වෙතත්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලය ගිවිසුම්ගත කිරීමේ වගකීම අධ්‍යක්ෂ (පිරිස් පාලන) වෙතත් පවරා ඇත. තවද, ලිපි ද්‍රව්‍ය වැය විෂයට අනුමත සීමිත ප්‍රතිපාදන තුල 35,000 ක් පමණ වන සිවිල් ආරක්ෂක බළකායේ එක් එක් සාමාජිකයා ගිවිසුම්ගත කිරීමට ගණනිත පිරිවැය සළකා, නිලධාරීන් ගිවිසුම් ගන්වා එකී ගිවිසුම් මුද්‍රණය නොකර, පරිගණකගත මෘදුපිටපත් ලෙස තබා ගන්නා ලෙස වැඩිදුරටත් උපදෙස් නිකුත් කරන ලදි.<br>ඒ අනුව, එකී කාර්යය 2022 වර්ෂ අවසානය වන විට ක්‍රියාත්මක කර සම්පූර්ණ කර ඇත. |
| 6. හඳුනාගත් දෙවන කාර්යසාධන දර්ශකයේ ළඟාවීම 50% ට වඩා අඩු මට්ටමක විය. | 2020 කාර්යසාධන වාර්තාවේ 4.1 යටතේ දක්වා ඇති කාර්යසාධන දර්ශක සටහනෙහි හඳුනාගත් දෙවන කාර්යසාධන දර්ශකයේ (2 වන තීරුව) ළඟා වීම 75-89% අතර දක්වා ඇති බව කාරුණිකව පෙන්වා දෙමි. |



දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

## 6. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

<table>
<tr><th>කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේශ</th><th>අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය</th></tr>
<tr><td colspan="2">පළමු කොටස</td></tr>
<tr><td>1. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.</td><td rowspan="4">වෙරළආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වැටුප් ගෙවීම්, ආදායම් රැස් කිරීම් සහ තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණ කටයුතු සිදු නොකරන අතර, අදාළ කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදාව යටතේ පාලනය වේ.</td></tr>
<tr><td>2. මුල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම අවම තරමින් නිලධාරින් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.</td></tr>
<tr><td>3. 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පලවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසරලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.</td></tr>
<tr><td>4. 2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු දෙවන සහ තෙවන මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි.</td></tr>
</table>

| | |
|---|---|
| 5. විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර දෙකක්වත් පවත්වා නොතිබුණි. | |
| 6. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | |
| 7. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | |
| 8. අදාළ විධිවිධාන වලට අනුකූලව රැස්කල ආදායම් ආපසු ගෙවා නොතිබුණි. | |
| 9. රැස්කර තිබූ ආදායම් නියමිත කාලය තුල නියාමානුකූල ලෙස බැහැර කර නොතිබුණි. | |
| දෙවන කොටස | |
| 1. 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරන චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි. | |

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

## 7. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

| කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේශ | අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය |
|---|---|
| **පළමු කොටස** | |
| 1. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | බාහිර කාර්යාල හා ප්‍රධාන කාර්යාල තොරතුරු අනුව ස්ථාවර වත්කම් ලේඛනයේ වාහන පිළිබඳ විස්තර වර්තමානය වන විට යාවත්කාලීන කර ඇත. |
| 2. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | ලබා දී ඇති බොහෝ විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු යවා ඇත.<br>එහෙත් දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර වූ යම් යම් ප්‍රායෝගික ගැටලු මත මසකට වඩා ප්‍රමාද වී ඇත. |
| 3. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ පළමු කාර්තුවේදී ඉදිරිපත් කරන ලද බොහෝ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර ඇතත් නිලධාරී තනතුර පුරප්පාඩු වීම මත පිළිතුරු ප්‍රමාද වී ඇත. |
| 4. 2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ආයතනය සතුව ඇති වාහන සම්බන්ධ තොරතුරු 2020.02.27 දිනැති ලිපිය මගින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. එසේම 2022.03.15 දින ගොඩනැගිලි භාවිතය පිළිබඳ තොරතුරු ද 2022.05.20 දින ඉඩම් භාවිතය පිළිබඳ තොරතුරු ද ඉදිරිපත් කර ඇත. (ඇමුණුම - 05, 06)<br>මෙම දෙපාර්තමේන්තුවෙ 2013 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ප්‍රධාන කාර්යාලයේ හා බාහිර කාර්යාල වල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වලින් ඉවත් වූ අපහරණය කළ භාණ්ඩ ඇතුළත් අදාළ ආකෘති පත්‍රයට අනුව සැකසූ වාර්තා 2022.10.21 දින කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. (ඇමුණුම - 07,08) ඉදිරියේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු නියමිත පරිදි කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |

| | |
|---|---|
| 5. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | කොරෝනා වසංගතය හේතුවෙන් කාර්යාල වසා තැබීම මත නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබී ඇත. මේ වන විට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වලින් අනාවරණය වූ අබලි භාණ්ඩ වෙන්දේසි කොට ඇත. |
